# දෙළුම් - පුනිකා ග්‍රැනටම්



පුනිකේසී නම් ශාක කුලයට ආයත්වන දෙළුම් ගස සම්භවය වී ඇත්තේ ඉරානය ආශ්‍රිත මධ්‍යම ආසියානු ප්‍රදේශයේය. අනාදිමත් කාලයක සිට මෙම බෝගය ආසියාව, යුරෝපය හා අප්‍රිකාවට අයත් වන මධ්‍යධරණී රටවල වගාකරනු ලැබේ. ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ දී පමණ මධ්‍යම හා දකුණු ඉන්දියාව වෙත හඳුන්වාදී ඇති දෙළුම් ගස දැන් ඉන්දියාවේ සෑම ප්‍රදේශයකම පාහේත්, බොහෝ අග්නිදිග ආසියානු රටවලත් වගා වේ.

පළතුරක් ලෙස අපරටේ වගා කරනු ලබන දෙළුම් සඳහා විසිතුරු පැලෑටියක් ලෙසද ඉල්ලුමක් පවතී. ගසෙහි හුරුබුහුටි බව හා දිගු කාලයක් පවතින අලංකාර මල් නිපදවීමට ඇති හැකියාව මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

මෙම පළතුරෙහි ඇති සුවිශේෂ බව නිසා එය සඳහා සැලකිය යුතු දේශීය හා විදේශීය ඉල්ලුමක් පවතී. එනිසා වගා වපසරිය වැඩි කිරීම හා අස්වැන්නේ ගුණාත්මය දියුණු කිරීමට පියවර ගැනීම වැදගත්ය.

දැනට දෙළුම් වගාව වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ පුත්තලම, අනුරාධපුරය, හම්බන්තොට, යාපනය හා මොණරාගල වැනි දිස්ත්‍රික්කයන්හිය. මෙම වගාව ඉතා පහසුවෙන් සෙසු වියළිකලාපීය ප්‍රදේශයන්හි ද ව්‍යාප්ත කළ හැකිය. එනිසා අක්කර 600 පමණ වන වර්තමාන දෙළුම් වගා වපසරිය වසර 2000 වනවිට අක්කර 1100 පමණ දක්වා වැඩි කිරීමට සැළසුම් කර තිබේ.

පෝෂ්‍ය ගුණය

දෙළුම් ගෙඩියේ ආහාරයට ගන්නා කොටසෙහි ග්‍රෑම් 100 ක අඩංගු ද්‍රව්‍ය

| | | | |
|---|---|---|---|
| ජලය | - | ග්‍රෑ. | 78 |
| ශක්තිය | - | කි.කැලරි | 65 |
| ප්‍රෝටීන් | - | ග්‍රෑ. | 1.6 |
| මේදය | - | ග්‍රෑ. | 0.1 |
| කාබෝහයිඩ්‍රේට් | - | ග්‍රෑ. | 14.5 |
| කැල්සියම් | - | මි.ග්‍රෑ. | 10 |
| පොස්පරස් | - | මි.ග්‍රෑ. | 70 |
| යකඩ | - | මි.ග්‍රෑ. | 0.3 |
| තයමින් | - | මයික්‍රො ග්‍රෑම් | 60 |
| රයිබොෆ්ලේවින් | - | මයික්‍රො ග්‍රෑම් | 100 |
| නයසින් | - | මි.ග්‍රෑ. | 0.3 |
| විටමින් සී | - | මි.ග්‍රෑ. | 16 |

පැසුන ගෙඩිවල බීජ වටා ඇති මාංසලය එලෙසම ආහාරයට ගත හැකිය. නැතහොත් මාංසලය මිරිකා මිහිරි පළතුරු බීමක් සකසා ගත හැකිය. ජෙලි නිපදවීමට ද මධ්‍යසාර වර්ග සමග මිශ්‍ර කිරීම සඳහා යොදාගන්නා ග්‍රෙනඩින් නම් සිරප් වර්ගය සදා ගැනීමට ද දෙළුම් යුෂ භාවිතා වේ.

## ඖෂධීය ගුණය

දෙළුම් ගසේ සෑම කොටසකම පාහේ ඖෂධීය ගුණ ඇති බව සලකනු ලැබේ. දෙළුම් මාංසලයේ යුෂය අජීර්ණය හා ලාදුරු සඳහා ප්‍රතිකාර කිරීමට යොදා ගැනේ. කදේ පොතු, කොළ, ළපටි ගෙඩි, සහ පැසුන ගෙඩි වල පොත්තෙහි ටැනින් නම් රසායනිකය අඩංගු නිසා පාචනය හා අභ්‍යන්තර ලේ වහනයවීම් සඳහා කරනු ලබන ප්‍රතිකාරයන් සඳහා භාවිතා වේ. තම්බා ගත් දෙළුම් කොළ ඇස් තැවීම සඳහා බහුල වශයෙන් භාවිතා කරනු ලැබේ.

## වෙනත් ප්‍රයෝජන

හම් පදම් කිරීම සඳහා, ටැනින් අඩංගු දෙළුම් ගසේ පොතු බහුල වශයෙන් භාවිතා වේ. මේරූ ගෙඩියේ පොත්ත සහ මල්, රෙදි වර්ණ ගැන්වීම සඳහා යොදා ගනු ලැබේ. ජපානයේ, කෘමි නාශකයක් නිපදවීම සඳහා ගසේ පොතු භාවිතා වේ.

## දේශගුණික අවශ්‍යතා

විවිධ දේශගුණික තත්ත්වයනට හොඳින් අනුවර්තනය වීමේ හැකියාවක් දෙළුම් ගසට තිබේ. උසස් ගුණාත්මයේ දෙළුම් ලබා ගත හැක්කේ ශීත කාලයක් හා තද උණුසුම් කාලයක් පවතින

ප්‍රදේශවලය. මෙම බෝගය ඉතා හොඳින්, දැඩි වියළි කාලගුණික තත්ත්වයනට ඔරොත්තු දේ. නමුත් එවැනි කාලගුණයක් පවතින ප්‍රදේශවල හොඳින් ඵල හට ගැනීමට නම් ජල සම්පාදන කළ යුතුය.

## පස

ගුණාංග වල විශාල වෙනස්කම් පවතින පස් වර්ග රාශියක දෙළුම් වගා කළ හැකිය. නමුත් උසස් අස්වැන්නක් ලබා ගැනීම සඳහා මැටි-ලෝම පසක් වඩා සුදුසුය. වෙනත් බොහෝ පළතුරු බෝග වලට වඩා පසෙහි පවතින ක්ෂාරීය තත්ත්වයට දෙළුම් ඔරොත්තු දේ. එසේම ආම්ලික පස්වල වුවද එය වගා කළ හැකිය.

## ප්‍රභේද

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ සඳහා වඩා සුදුසු දෙළුම් ප්‍රභේද නිශ්චිතව තවම හඳුනා ගෙන නොමැත. නමුත් ගුණාත්මයෙන් උසස් ගෙඩි හටගන්නා ගස් වලින් සිටුවීම සඳහා පැල ලබා ගැනීම වැදගත්ය. දැනටමත් දේශීය මෙන්ම විදේශයන්ගෙන් ලබාගත් ප්‍රභේද රාශියක් පිළිබඳ අධ්‍යයන කටයුතු සිදුවෙමින් පවතී. මෙමගින් අප රටට වඩා ගැලපෙන ප්‍රභේද හඳුනා ගැනීමට ඉදිරියේදී හැකිවනු ඇත.

## රෝපණ ද්‍රව්‍ය සකසා ගැනීම

සිටුවීම සඳහා යොදා ගන්නා දෙළුම් පැල ප්‍රධාන ආකාර තුනකට නිපදවා ගත හැකිය.

## බීජ පැල

තෝරා ගත් මේරූ ගස් වලින් ලබාගන්නා බීජ තවාන් කළ විට ඉතා පහසුවෙන් ප්‍රරෝහණය වේ. මෙවැනි පැල මාස 9-12 පමණ ගතවූ පසුව සිටුවීමට සුදුසු තත්ත්වයට පත්වේ. දෙළුම් ශාකයේ පර පරාගනය මෙන්ම ස්ව පරාගනය ද සිදුවේ. එනිසා, මේ අන්දමට බීජ මගින් ලබා ගන්නා පැල වල මව් ශාකයට වඩා වෙනස් ලක්ෂණ තිබිය හැකිය. බීජ පැල සිටුවීම එතරම් සතුටුදායක ක්‍රමයක් ලෙස නොසලකන්නේ එනිසාය.

## මුල් ඇද්ද වූ දඬු කැබලි

මේ සඳහා උසස් ලක්ෂණ සහිත මව් ශාකයකින්, සෙන්ටිමීටරයක් පමණ මහත මේරූ දඬු කැබලි තෝරාගන්න. එම දඬු කැබලි සෙ.මී. 20-30 පමණ දිගක් සහිත වන සේ කපාගන්න.



මෙම දඬු කැබලිවල දිගින් 2/3 පමණ පසට යටවන සේ සකස් කරගත් පාත්ති වල සිටුවන්න. සමහර අවස්ථා වලදී දඬු කැබැල්ල සම්පූර්ණයෙන්ම වුවද පසට යටකර සිටුවනු ලැබේ. මෙම දඬු කැබලි ප්‍රරෝහණය වීමෙන් ඇතිවන පැල වසරකදී පමණ ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට පත් වේ. විශේෂ ප්‍රචාරක ව්‍යුහයක් (ප්‍රොපගේටරයක්) තුල මෙම අතු කැබලි මුල් අද්දවා ගැනීමට කටයුතු කිරීම මගින් වඩා සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය.

## වායව අතු බැඳීම

මෙයට අමතරව වායව අතු බැඳීම මගින් ද සතුටුදායකව පැල නිපදවා ගත හැකිය. නමුත් පැල විශාල සංඛ්‍යාවක් නිපදවා ගැනීම සඳහා මෙය එතරම් ප්‍රායෝගික ක්‍රමයක් නොවීමට ඉඩ ඇත.

පරතරය - මීටර් 3 × 3




## බිම් සැකසීම

ඉහත පරතරයට අනුව සෙ.මී. 60×60×60 ප්‍රමාණයේ වලවල කපන්න. මතුපිට පස් හා හොඳින් දිරාපත් වූ ගොම පොහොර ආදිය යොදා මෙම වලවල් පුරවන්න.

## පැල සිටුවීම

වර්ෂා කාලය ආරම්භවීමත් සමග සකස් කරගත් වලවල් වල පැල සිටුවන්න. පැලය අවට පස ඉක්මණින් වියළීයාම වලකා ගැනීම සඳහා වියළි තණකොළ වැනි ද්‍රව්‍යයකින් වසුන් කරන්න.

## පොහොර යෙදීම

වර්ධනයේ මුල් අවස්ථාවන්හි දී හොඳින් දිරාපත් වූ කාබනික ද්‍රව්‍ය ගස වටා යොදා පසට කළවම් කරන්න.



පැල සිටුවා වසරක් පමණ ගතවූ පසුව පැල වටා රවුමක ආකාරයට පස ඉවත් කරන්න. ගසේ වර්ධනය අනුව මෙලෙස පස් ඉවත් කළයුතු ප්‍රදේශයේ විශාලත්වය මීටර 1-1 1/2 පමණ විය හැකිය. පස් ඉවත් කළ ප්‍රදේශයට හොඳින් දිරාපත් වූ ගොම පොහොර හෝ කාබනික ද්‍රව්‍ය යොදා නැවත පස් වලින් වසන්න. වර්ෂා කාලය ආරම්භ වීමත් සමග මෙය කිරීම වඩා සුදුසුය.

පසේ සරුබව අඩුනම් සහ ගසේ වර්ධනය දුර්වල නම් ගොම පොහොර සමග යූරියා පොහොර ග්‍රෑම් 100 - 150 පමණ ද සෑම ගසකටම යොදන්න.

## ජල සම්පාදනය

වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා වියළි කාල වලදී ගසට ජලය සපයන්න. මේ අන්දමට සපයනු ලබන ජලය තරමක් ලවණ සහිත වුවද එමගින් ගසට හානියක් සිදු නොවේ.

## වල් පැළෑටි පාලනය

ගස වටා ඇති ප්‍රදේශය වල් පැල වලින් තොරව තබාගන්න. වියළි තෘණ වැනි ද්‍රව්‍යයක් භාවිතා කර මෙම ප්‍රදේශය වසුන් කරන්න. මෙමගින් වල් පැළෑටි පාලනය වේ. පැල පේලි අතර විසිකැත්තක් වැනි දෙයක් මගින් වල් පැළෑටි පාලනය කළ හැකිය.



## ගස් පුහුණු කිරීම

ආරම්භයේ සිටම දෙළුම් ගස් ක්‍රමානුකූලව පුහුණු කිරීම මගින් ගසට මනා පෙනුමක් මෙන්ම උසස් ගුණාත්මයේ අස්වැන්නක් ද ලබාගත හැකි වේ.

ගස් පුහුණු කිරීම තනි කඳක් ලෙස පවතින සේ කළ හැකිය. නමුත් බොහෝ විට කරනු ලබන්නේ ගසේ පහළ සිට ප්‍රධාන අතු 3-4 පමණ සංඛ්‍යාවක් වර්ධනය වීමට ඉඩ සැලසීමයි. මෙම සැකිල්ල ඇතිකර ගත් පසුව ප්‍රධාන අතුවල පහළ ප්‍රදේශයෙන් හෝ මුල් වලින් හට ගන්නා දිය රිකිලි වැනි අතු ඉවත් කරන්න. විශේෂයෙන් මෙය වැදගත් වන්නේ බෝගයේ මුල් වසර කීපය තුලදීය.

මෙයට අමතරව, අනවශ්‍ය ලෙස දිගට වැඩෙන අතු කෙටි කිරීම ද, පොළව සමග ස්පර්ශ වන සහ, ඉතා පහළින් හටගන්නා අතු ඉවත් කිරීම ද ගසේ ඇති අනවශ්‍ය අතු ඉවත් කිරීම ද වරින් වර කළ යුතුය.

## කෘමි හානි පාලනය

### දෙළුම් සමනලයා - විරකෝලා අයිසොක්‍රේටස්

අළු පැහැයට හුරු දම් පැහැති මෙම සමනලයා මල් කැකුළු හා ළපටි ගෙඩි වල පහළ කෙළවර ප්‍රදේශයේ බිත්තර දමයි. බිත්තර වලින් පිටවන කීටයා ගෙඩිය තුලට ඇතුල් වී එයට හානි පමුණුවයි. මෙවැනි ගෙඩි ප්‍රයෝජනයට ගත නොහැකිය.

මෙම කෘමි හානිය පාලනය කිරීම සඳහා රසායනික ද්‍රව්‍ය යෙදීම අපහසුය. එයට හේතුවී ඇත්තේ ඕනෑම අවස්ථාවක වර්ධනයේ විවිධ අවස්ථාවන්හි ඇති ගෙඩි දෙළුම් ගස්වල දක්නට ලැබීමයි.

ළපටි අවස්ථාවේදී කඩදාසි උර වැනි දෙයකින් ගෙඩි ආවරණය කිරීමෙන් මෙම හානිය පාලනය කරගත හැකිය.

මෙයට අමතරව කඳ විදින පනුවන් විසින හානි පැමිණවීම නිසා කෙළවර සිට අතු මැරීයාමට ඉඩ තිබේ. සුදු මැස්සන් පිටි මකුණන් හා කොරපොතු කෘමීන් මගින් ද වගාවට සුළු හානි ඇතිවිය හැකිය. වියළි කාල වලදී වේයන් විසින් ගසේ කඳට හානි පැමිණවිය හැකිය. මෙය පාලනය කිරීම සඳහා කළු තෙල් වැනි ද්‍රව්‍යයකින් කඳේ පහළ කොටස ආලේප කිරීම සුදුසුය.

## රෝග පාලනය

## අස්වනු නෙලීම

දෙළුම් ගසේ වසර පුරාම මල් හටගනී. නමුත් වර්ෂා කාලයේදී හටගන්නා මල් සංඛ්‍යාව වැඩිය. එනිසා වියළි කාලයකදී වුවද ගස වටා හොඳින් පොහොර යොදා ජලය සැපයිය හැකිනම් මල් වැඩි සංඛ්‍යාවක් හටගන්වා ගත හැකිය. මල් හට ගෙන මාස 6-7 පසුව අස්වනු නෙලා ගැනීමට පුළුවන..

අස්වනු නෙලීමට සුදුසු අවස්ථාවට පත්වී ඇති බව තීරණය කිරීම සඳහා ඇඟිලි වලින් ගෙඩි වලට තට්ටු කරන්න. එවිට ඇතිවන විශේෂිත ශබ්දය මගින් පැසුන ගෙඩි පහසුවෙන් හඳුනා ගත හැකිය. අස්වනු නෙලා ගැනීමෙන් පසුව තවදුරටත් ගෙඩි ඉදීම සිදු නොවේ. එනිසා නෙලීමට වඩා සුදුසු අවස්ථාවේ ඇති ගෙඩි පමණක් තෝරා ගැනීම වැදගත්ය.

ගෙඩි නෙලාගත යුත්තේ පිහියකින් නටුව කපා ගැනීමෙනි. වෙළඳ පොලට ඉදිරිපත් කිරීමට පෙර ගෙඩියට ආසන්නයෙන් නටුව කපා ඉවත් කළ යුතුය..



සමහර රටවල දෙළුම් ගෙඩි මිළදී ගන්නේ මේස සැරසිලි

සඳහා යොදා ගැනීමටය. එනිසා ගෙඩියේ බාහිර පෙනුම උසස් මට්ටමකින් පවත්වා ගැනීම වැදගත්ය. සමහර විට තද හිරු එළිය නිසා ගෙඩියේ පිට පොත්ත රළුවීම හෝ දුර්වර්ණ වීම හෝ සිදුවිය හැකිය.

## අස්වැන්න

වසරකදී එක් ගසකින් ගෙඩි 70 - 200 පමණ සංඛ්‍යාවක් නෙලාගත හැකිය. ගසේ වයස හා පාලන ක්‍රම වල යෝග්‍යතාවය මත ලබාගත හැකි ගෙඩි සංඛ්‍යාව තීරණය වේ.

## වෙළඳ පොල වෙත සැකසීම

ගෙඩි වල විශාලත්වය අනුව ශ්‍රේණි කරන්න. ඉන්පසු කඩදාසි හෝ පිදුරු වැනි දෙයකින් ගෙඩි ආවරණය කර පෙට්ටිවල අසුරන්න.

## ගබඩා කිරීම



දෙළුම් නිසි ගබඩා තත්ත්වයන් යටතේ දිගු කලක් ගබඩාකර තබාගත හැකි පළතුරකි. සෙන්ටි ග්‍රේඩ් අංශක 0 - 5 උෂ්ණත්වයක් සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය 80 - 85% යටතේ, ගෙඩි වල බාහිර පෙනුමට හානි නොවන පරිදි මාස 7 පමණ කාලයක් දෙළුම් ගෙඩි සතුටුදායකව ගබඩා කර තබාගත හැකිය. ගබඩා කාලය තුලදී ගෙඩියේ යුෂ ප්‍රමාණය හා සුවඳ වැඩි වේ.

## අපනයන වෙළඳ පොල

ඊජිප්තුව, ඉන්දියාව, ඉරානය, ස්පාඤ්ඤය වැනි රටවල් මගින් එක්සත් රාජධානිය වැනි යුරෝපීය රටවල් වෙත දෙළුම් අපනයනය කරනු ලැබේ. නිසි තත්ත්වයන් යටතේ දිගු කලක් හොඳින් ගබඩා කර තබාගත හැකි පළතුරක් නිසා ඉතා පහසුවෙන් නැව් මගින් ප්‍රවාහනය කළ හැකිය. පෙට්ටි වල අසුරා ඇති දෙළුම් විවිධ බර ප්‍රමාණයන්ගෙන් යුත් ඇසුරුම් ලෙස අපනයනය කරනු ලැබේ. එනිසා උසස් වර්ග වල දෙළුම් ගෙඩි අපනයනය සඳහා අප රටට ද හැකියාවක් තිබේ.

## ශ්‍රම අවශ්‍යතාව

අක්කරයක ක්‍රමානුකූලව දෙළුම් වගා කිරීම සඳහා පළමු වසර තුල දී අවශ්‍යවන ශ්‍රමය.

| කාර්යය | ශ්‍රම දින |
|---|---|
| මූලික බිම් සැකසීම හා පස සංරක්ෂණය | 14 |
| වලවල් සළකු-ණු කිරීම හා කැපීම | 16 |
| කාබනික හා මූලික පොහොර යෙදීම | 04 |
| පැළ සිටුවීම | 08 |
| සෙවන සැපයීම | 04 |
| පොහොර යෙදීම හා වල් මර්ධනය | 08 |
| ජල සම්පාදනය | 16 |
| වෙනත් නඩත්තු කටයුතු | 04 |
| එකතුව | 74 |